බෝ සෙවණ පදනම

Bo Sewana Foundation

සුව සෙත පිණිස මනුදම්

# බෝ සෙවණ පදනම

## පදනම හැඳින්වීම

2018 වර්ෂයේදී ආරම්භ කරන්නට යෙදුනු අපගේ පදනම සමස්ත ප්‍රජාවගේ ආකල්ප දැනුම, කුසලතා සහ අධ්‍යාපන සංවර්ධනය, දිළිදු පවුල් නගාසිටුවීම, වැඩිහිටියන් රැකගැනීමට අවශ්‍ය පහසුකම් ලබා දීම, හිංසාව අවැසි ඔවුන්ට සවියක් වෙමින් අප දේශය තුල රුක් රෝපණය කරමින් හරිත දේශයක් නිර්මාණය කිරීමට අඛණ්ඩව කැපවීම අප බෝ සෙවණ පදනමින් සිදුකෙරේ.

## දැක්ම

හිංසාව අවැසි වුවන්ට සවියක් වෙමින් දරුවන් සහ වැඩිහිටියන්ගේ අනාගතය සුරක්ෂිත කරමින් හරිත දේශයක් ගොඩනැගීමට අඛණ්ඩව කැපවීම.

## මෙහෙවර

දිළිදු පවුල් සහ එම දරුවන්ගේ දැනුම ආකල්ප, කුසලතා සංවර්ධනයත් ආර්ථික වශයෙන් සවියක් වෙමින් දරුවන් වැඩිහිටියන් රැකගැනීමට අවශ්‍යය පහසුකම් ලබා දීමත් අප දේශය තුල රුක් රෝපණය කරමින් හරිත දේශයක් නිර්මාණය කිරීමට අඛණ්ඩව කැපවීම.

## අරමුණ

(i) අඩු ආදායම්ලාභී පවුල් වල දරුවන්, තරුණ හා වැඩිහිටියන්ගේ ජීවිත නගා සිටුවීම.

(ii) දරුවන්ගේ අධ්‍යාපන හා වෘත්තීය කුසලතා වැඩි දියුණු කිරීම.

(iii) ස්වාභාවික සහ අස්වාභාවික විපත් වලදී සහයෝගය ලබා දීම.

(iv) ගැබිණි මව්වරුන් සඳහා පෝෂණ ද්‍රව්‍ය ලබා දීම.

(v) සෞඛ්‍යය සංවර්ධනය සඳහා අවශ්‍යය සායන සහ වැඩමුළු පැවැත්වීම.

## ව්‍යාපෘති හැඳින්වීම

හිංසාව ඇවැසි වුවන් අරමුණු කරගත් සංවර්ධනය සමස්ථ ප්‍රජාවගේ යහපත් පෞර්ෂත්වය ගොඩනැගීම සඳහා පදනම විසින් සිදුකරනු ලබන ව්‍යාපෘති ලෙස දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වලට අවශ්‍යය අධ්‍යාපන උපකරණ ලබා දීම, නිවෙස් නොමැති අසරණ වූ ජනතාවට නිවාස ඉදිකර දීම, විශේෂ අවශ්‍යතා වූ අසරණ අපේම ජනතාවට රෝද පුටු, කිහිලිකරු, කෘත්‍රිම පාද, ශ්‍රවණාධාර, ඇස් කණ්ණාඩි ඇතුළු උපකරණ එම පුද්ගලයන්ට ලබා දීම. අඩුආදායම් ලාභී දිළිදු පවුල් වෙත වියලි ආහාර ලබා දීම, බරපතල රෝගාබාධයෙන් පෙළෙන අපේම ජනතාවට ඖෂධ ලබා දීම, වෛද්‍ය සායන පැවැත්වීම, සමාජයේ ජීවත්වන ප්‍රජාව උදෙසා ඔවුන්ගේ යහපත් ආකල්ප දැනුම කුසලතා සහ අධ්‍යාත්මික සංවර්ධනය වන පරිදි මෙම මාතෘකා මුල් කර ගනිමින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදුකරනු ලබයි.

## ව්‍යාපෘති ගැටළු

අප සමාජයේ ජීවත් වන පුරවැසියන්ගෙන් සැලකිය යුතු පිරිසක් අඩු ආදායම් ලාභීන් බවට පත්ව් ඇත. එම තත්වය මත එම පවුල් වල දරුවන්ට අධ්‍යාපන කටයුතු කරගෙන යාමට ද එම පවුල් සමාජිකයින්ට අඩු පොෂණ මට්ටමක් පවතින බැවින් ද, යම් අවස්තා වලදී දිලිදු පවුල් වල පුද්ගලයින්ට ඖෂධ ලබා ගැනිමට ද අපහසුතා ඇත. ඇතැම් දිලිදු පවුල් වලට හිසට සෙවනක් නොමැතිව මහමග ජීවත්වන ස්භාවයක් ද දක්නට තිබේ. තවද අප දේශය ඉතා සිග්‍රලෙස වනාන්තර විනාශයද සිදුවෙමින් පැවතිම ව්‍යාපෘති ගැටළු ලෙස හදුනාගෙන ඇත.

## ව්‍යාපෘති අරමුණු

(i) අප සමාජයේ පුරවැසියන් දිලිදු කමින් මුදවා ගැනිමත්, සමාජයට යහපත් පුරවැසියන් බිහිකිරීම.

(ii) අධ්‍යාපන සංවර්ධනයට දායක වීම,

(iii) සෞඛ්‍ය සංවර්ධනයට අත හිත දීම.

(iv) රැක් රෝපණයට දායක වීමෙන් හරිත දේශයක් ගොඩනැගීම.

## ප්‍රතිලිභීන්

මෙම ව්‍යාපෘති මගින් ඍජු ප්‍රතිලාභින් ලෙස දිලිදු පවුල් , එම පවුල් වල පාසල් දරුවන් , රෝගී තත්වයට පත්ව ඇති අසරණ පුද්ගලයින් ප්‍රතිලාභින් ලෙස දැක්විය හැක.

## ව්‍යාපෘති සිදුකරන ආකාරය

අප විසින් යම් ව්‍යාපෘතියක් සඳහා ප්‍රතිලාභීන් තෝරා ගනු ලබන්නේ ප්‍රදේශයන් හී ග්‍රාම නිලධාරීන්ගේ
සොයාබැලිමෙන් අනතුරුව පුළුල් වු නිරීක්ෂනයකින් ද පසුවය.

ප්‍රතිලාභින් තෝරාගැනීමෙන් අනතුරුව අදාල ව්‍යපෘතිය සැලසුම් කරනු ලැබේ.

සැලසුම් කල ව්‍යාපෘතින් ක්‍රියාත්මක වනුයේ ප්‍රදේශයේ ග්‍රාම සේවක නිලධාරීන් හා ප්‍රදේශය භාර පොලිසියේද, ප්‍රාදේශිය ලේකම් කාර්‍යාලයෙහි නිලධාරීන්ගේ සහභාගීත්වය ද අධීක්ෂණය සහ බෝ සෙවණ පදනමේ
අනුශාසක මණ්ඩලයේ මුලිකත්වයෙන් හා පදනමේ නිලධාරීන්ගේ කැපවීමෙන් මෙම ව්‍යාපෘතින් සිදුකරනු ලබයි.



බෝ සෙවණ පදනමේ නිර්මාතෘ
පුජ්‍ය බැරගම සුමන හිමි

## Bosewana Foundation

Reg. No : G A 00241664

## Lotus Academy

Reg. No : P V 00307200

## බෝ සෙවණ පදනම සමඟ
## පහත සඳහන් ක්‍රම ඔස්සේ සම්බන්ධ වෙමු


බෝ සෙවණ පදනම
අංක 188, වැලිපැන්න පාර, අළුත්ගම, ශ්‍රී ලංකාව

+94 034 22 96 990

+94 071 67 55 600

+94 071 67 55 600

bosewanafoundation@gmail.com

www.bosewanafoundation.com

facebook.com/bosewana foundation

youtube.com/bosewana foundation


බෝ සෙවණ පදනම
Bo Sewana Foundation

# ව්‍යාපෘති යෝජනා

- බෝ සෙවණ පුස්තකාලය
- බෝ සෙවණ කෞතුකාගාරය
- බෝ සෙවණ පෙර පාසල
- බෝ සෙවණ ළමා සුරකුම් මධ්‍යස්ථානය

බෝ සෙවණ පදනම
Bo Sewana Foundation

# 01. බෝ සෙවණ පුස්තකාලය

දීප ව්‍යාප්තව දැනුම ගවේෂණය කරන දුවා දරුවන් සහ වැඩිහිටියන් හට දැනුම ලබාගැනීමට සහ වර්ධනය කර ගැනීමට බෝ සෙවණ පුස්තකාලය මගින් පිටුවහලක් ලබා දීම අරමුණ කරගනිමින් මෙම ආයතනය පිහිටුවනු ලබයි.

එහිදි මෙම ආයතනයට සම්බන්ධවී කටයුතු කරන දෙස්, විදෙස් සියලුම පරිශිලකයන්ට අවශ්‍ය පොත් පත් බෝ සෙවණ පදනමේ නිල වෙබ් අඩවියට පිවිසිම තුලින් විමසා බලා පුස්තකාලයට පැමිණ රැගෙන යාම හෝ සියළු යටිතල පහසුකම් සහිතව පුස්තකාල පරිශ්‍රයේදීම පොත පත පරිශිලනය කරගත හැක. දෛනිකව නිකුත් වන පත්තර පරිශීලනයට  අවශ්‍ය අවකාශයද ආයතන භූමියයේ පවතින අතර, වෙනත් තොරතුරු සොයා බැලීම සඳහා නොමිලේ අන්තර්ජාල පහසුකම් ආයතන භූමියේදී සලසා  දෙනු ඇත. එබැවින් බෝ සෙවණ රුක්ෂයෙන් සෙවණ සහ පහස ලබමින් රෝපණය වන බෝ සෙවණ පුස්තකාලය බෝ සෙවණ පදනම් පවුලේ දැවැන්ත සමාජ සත්කාරයක් ලෙස රටට දායාද කර දීමට සැදි පැහැදි සිටි.



බෝ සෙවණ පදනම
Bo Sewana Foundation

# 02. බෝ සෙවණ කෞතුකාගාරය

අතීතයේ ජන ජීවිතය පිළිබඳව පුළුල් අවබෝධයක් ලබා දීම සහ කෞතුක භාණ්ඩ සංරක්ෂණයත් වර්තමාන ජන ජීවිතය තුල පරිහරනය කරන දෑ සංරක්ෂණය කරමින් අතීතයෙත් වර්ථමානයත් අතර වඩා හොඳ සංකලනයක් ගොඩ නගමින්, අනාගත පරපුර උදෙසා කෞතුක වස්තූන් සංරක්ෂණය කරමින්  සහ ප්‍රදර්ශණය කරමින්, පුළුල් දැනුම් සම්භාරයක් අතැතිව සහ ආයතනයේ මගපෙන්වන්නන් මගින් අවශ්‍ය භාෂා ශෛලයක් උපයෝගි කරගනිමින්, දැනුම මහජනතාව උදෙසා බෙදා දෙමින් වඩා උසස් තත්වයෙන්, ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් සියලු පුරවැසියන්ට නැරඹීමට හැකිවන පරිදි වැඩිම එකතුවකින් යුතු කෞතුක වස්තූන් සපයාගනිමින් ශ්‍රී ලංකාවේ අතීතය ගවේෂණය කරමින්, වර්ථමානයට ආලෝකයක් වෙමින්, ඉදිරි අනාගතයට ගැලපන ජාත්‍යන්තර මට්ටමේ කෞතුකාගාරයක් රටට දායාද කරදීම බෝ සෙවණ පදනමේ අරමුණයි.



## 03. බෝ සෙවණ පෙරපාසල

අඩු ආදයම්ලාභී පවුල් වල පෙරපාසල් අධ්‍යාපනය හැදෑරීම සඳහා සුදුසුකම් සපුරණ දුවා දරුවන්ට පෙර පාසල මගින් පූර්ව ළමාවිය සංවර්ධන මූලික අධ්‍යාපනය නොමිලේ ලබා දීම අරමුණු කර ගනිමින් බෝ සෙවණ පෙර පාසල පිහිටුවනු ලබයි.

### 03.(i) පෙර පාසලට ඇතුලත් වීමට අවශ්‍ය අවම සුදුසුකම්

බෝ සෙවණ පෙර පාසල සදහා ළමුන් ඇතුලත් කිරීමේදී අදාල අඩු ආදායම් ලාභී පවුලේ භාරකරු විසින් ලිඛිත ඉල්ලීමක් ආයතන ප්‍රධානි වෙත යොමුකල යුතු අතර එම ඉල්ලීම සලකා බැලීමෙන් අනතුරුව ආයතනය මගින් ලබා දෙන අයදුම් පත සම්පූර්ණ කර, ග්‍රාම සේවා නිලධාරීතුමා /තුමියගේ නිර්දේශයත් සමඟ ආයතනය වෙත භාර දිය යුතුවේ. අනතුරුව බෝ සෙවණ පදනමේ සභාපති හිමියන්ගේ මූලිකත්වය ඇතිව නිලධාරී මඩුල්ලේ සහ අනුසාශක මණ්ඩලයේ පූර්ණ අධීක්ෂණයෙන් අනතුරුව දරුවා බෝ සෙවණ පෙර පාසල වෙත තෝරා ගනු ලබයි.

### 03.(ii)බෝ සෙවණ පෙරපාසල් අධ්‍යාපනය ලබන දරුවන් සඳහා බෝ සෙවණ පදනමින් හිමිවන ප්‍රතිලාභ

(a) අඩු ආදායම්ලාභි පවුල් සදහා සිදුකරන මෙම සමාජ සත්කාර බෝ සෙවණ පදනමේ මෙහෙවරක් ලෙස සිදු කරයි

(b) බෝ සෙවණ පෙර පාසලේ සියළු අධ්‍යාපන කටයුතු බෝ සෙවණ පදනමේ ප්‍රතිලාභ මත නොමිලේ සිදුකරයි.

(c) පෙර පාසල් අධ්‍යාපනයේදී අවශ්‍ය පොත් පත්, ලිපි ද්‍රව්‍ය සහ අනෙකුත් අවශ්‍ය පහසුකම් ඇතුලුව පෙරපාසල පවත්වාගෙන යෑම සදහා අවශ්‍ය පහසුකම් බෝ සෙවණ පදනම මගින් සම්පාදනය කරනු ලබයි.

(d) බෝ සෙවණ පෙරපාසලේ අධ්‍යාපන කටයුතු සලසන ගුරු භවතුන් හට මාසික වේතනය බෝ සෙවණ පදම මගින් ලබා දෙන බැවින් ඒ සදහා දරුවන්ගෙන් කිසිදු මුදලන් අය නොකෙරේ.



බෝ සෙවණ පදනම
Bo Sewana Foundation

# 04. බෝ සෙවණ ළමා සුරකුම් මධ්‍යස්ථානය

ශ්‍රී ලංකව තුල මාපිය සෙනෙහස අහිමිව හව්හරනක් සොයන දුවා දරුවන් උදෙසා යාථාර්තයක් වු මා පිය සෙනෙහස දායද කර දීම බෝ සෙවණ ළමා සුරකුම් මධ්‍යස්ථානයේ අරමුණයි.

මෙම කටයුත්ත සදහා දුවා දරුවන් තෝරා ගැනීමේදි, ඔවුන් මනා සෞඛ්‍ය තත්වයකින් හෙබි විය යුතු  අතර, එම දරුවන් බෝ සෙවණ ළමා සුරකුම් මධ්‍යස්ථානයට යොමු කල දින සිට අවශ්‍ය සෙනෙහස, රැකවරණය, ප්‍රථමික අංශයේ සිට උසස් අධ්‍යාපනය දක්වා අධ්‍යාපනය, සෞඛ්‍ය, ආහාර පාන, ඇදුම්, සහ දැනුම කුසලතා වර්ධනය, බෝ සෙවණ පදනමේ සමාජීය සත්කාර යටතේ සිදු කරනු ලබන අතර, දරුවා සමාජ ගත කරන මොහොත දක්වා බෝ සෙවණ පදනම මගින් එක් එක් දරුවා වෙනුවෙන් ප්‍රතිලාභ වෙන් කරනු ලබන අතර රජයේ සහ රජයට සම්බන්ධ ආයතන වල නිතීරිති වලට යටත්ව සහ බෝ සෙවණ පදනමේ නිති මාලාවට යටත්වද ළමයාව සමාජගත කිරීම සිදු කරනු ලබයි.

## 04.(i) බෝ සෙවණ ළමා සුරකුම් මධ්‍යාස්ථානය මගින් දරුවන්ට හිමි වන ප්‍රතිලාභ

(a) වයස අවුරුදු 6 සිට දරුවා සමාජගත කරන මොහොත දක්වාම ආයතනය මගින් ඉතා සුරක්ෂිතව සහ සුහදශිලිව අනාගතයට දරුවා රැගෙන යාම.

(b) දරුවා බෝ සෙවණ ළමා සුරකුම් මධ්‍යස්ථානයට භාරගැනිමෙන් පසුව දරුවා සමාජ ගත කරන දින දක්වා අවශ්‍ය ආහාර පාන, ඇදුම් පැළදුම්, සෞඛ්‍ය, අධ්‍යාපන සහ අනෙකුත් අවශ්‍ය පහුසුකම් නොමිලේ ලබා දීම.

(c) දරුවා පාසල් අධ්‍යාපන කටයුතු අවසන් කිරීමෙන් අනතුරුව දරුවාගේ අභිමතය පරිදි සහ බෝ සෙවණ පදනමේ මග පෙන්වීම සහ මෙහෙය වීම මත රැකියා ඉලක්ක කරගත් තාක්ෂණික හෝ කාර්මික දැනුම දරුවාට ලබා දීම.

(d) දරුවා සමාජ ගත කරන මොහොතේදී බෝ සෙවණ පදනමේ නිති රීති වලට සහ රජයේ සහ අනුබද්ධ ආයතන වල නිතී මාලාවට ප්‍රමුඛතාවය දෙමින් සහ දරුවාගේ මානුෂිය තත්වයන් සලකා බලමින් දරුවාව සමාජ ගත කරනු ලබයි.



# ව්‍යාපෘති ස්ථානය



# බො සෙවණ පදනමේ ගෝලීය සබදතා පුළුල් කිරීම



බෝ සෙවණ පදනම

**Bo Sewana Foundation**

සුව සෙත පිණිස මනුදම්